# ජාතික ජනතා පක්ෂය

# පක්ෂ ව්‍යවස්ථාව

# ජාතික ජනතා පක්ෂය- පක්ෂ ව්‍යවස්ථාව

## 1 වන වගන්තිය : පක්ෂය

1:1 පක්ෂයේ නම : ජාතික ජනතා පක්ෂය
: National Peoples Party

1:2 පාට සහ ලාංඡනය :

## 2 වන වගන්තිය : අරමුණු සහ පරමාර්ථ

2:1 ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක යහ පැවැත්ම උදෙසා පුරවැසියන්ගේ තත් වැදගත් නිදහස සුරක්ෂිත කිරීම

2:2 සියලු දෙනාටම තම ආර්ථික වර්ධනය ලබා ගැනීමට සම අවස්ථා ලබා ගත හැකි ආර්ථිකයක් ඇති කිරීම.

2:3 නීතිය හා එහි ආධිපත්‍යය පිළිගත් නිදහස් සමාජ ක්‍රමයක් බිහි කිරීම.

2:4 රටේ සියලු ජන කොටස් වලට ජාති ආගම් සහ අනෙකුත් වාද භේද වලින් තොරව මිනිස් අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය පදනම් කර ගත් සමාජයක් බිහි කිරීම

## 3 වන වගන්තිය : පක්ෂ ව්‍යුහය

ජාතික ජනතා පක්ෂය පහත දැක්වෙන ප්‍රධාන සංවිධාන වලින් යුක්ත වන්නේය.

ජාතික මහා සම්මේලනය
සමස්ත ලංකා කාරක සභාව
විධායක සභාව
ස්ථාවර කමිටු
දිස්ත්‍රික් කමිටු
ආසන සංවිධාන
ශාඛා සංවිධාන
අනුබද්ධ සංවිධාන

## 4 වන වගන්තිය : ජාතික මහා සම්මේලනය

4:1 ජාතික මහා සම්මේලනය පක්ෂයේ උත්තරීතර මණ්ඩලය වන්නේය.

4:2 ජාතික මහා සම්මේලනය යටත් පිරිසෙයින් වර්ෂ 5කට වරක් කැඳවිය යුතුය.

4:3 ජාතික මහා සම්මේලනය පක්ෂයේ සියලුම සාමාජිකයන්ගෙන් සමන්විත වනු ඇත.

4:4 සමස්ත ලංකා කාරක සභාව විසින් නිර්දේශිත, පක්ෂයේ ප්‍රතිපත්ති සංශෝධනය පිළිබඳ කෙටුම්පත් අනුමත කිරීම ජාතික මහා සම්මේලනයේ වගකීමක් විය යුතුය.

4:5 මහ ලේකම් වාර්තාව, ජාතික සංවිධායක වාර්තාව,හා අය වැය වාර්තාව ජාතික මහා සම්මේලනයට ඉදිරිපත් කිරීම කල යුතුය.

4:6 අවශ්‍ය වූ විටකදී විශේෂ ජාතික මහා සම්මේලනයක් කැඳවිය හැක.

## 5 වන වගන්තිය : සමස්ත ලංකා කාරක සභාව

5:1 දිස්ත්‍රික් කමිටු සභාපතිවරු හා ලේකම්වරු, එක් දිස්ත්‍රික් කමිටුවක නියෝජිතයන් හතර දෙනෙකු බැගින් තෝරා ගත් නියෝජිතයන්, අනුබද්ධ සංවිධාන වල නියෝජිතයන් හය දෙනෙකු බැගින් වන නියෝජිතයන්, පක්ෂයේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රිවරු, හා සෑම ආසන සංවිධායකවරයෙක් යන අයගෙන් සමස්ත ලංකා කාරක සභාව සමන්විතය.

එසේම විධායක සභාව විසින් නම් කල හැකි 10 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්ද සමස්ත ලංකා කාරක සභාවට ඇතුලත් වේ.

5:2 බලතල හා වගකීම්

5:2:1 පක්ෂයේ විධායක සභාවට නිලධාරින් ඇතුලු විධායක සභිකයන් පත් කිරීම

5:2:2 පක්ෂයේ ව්‍යවස්ථා සංශෝධනය කිරීම

5:2:3 විධායක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන පක්ෂයේ ප්‍රතිපත්ති සංශෝධන කෙටුම්පත් ජාතික මහා සම්මේලනයට ඉදිරිපත් කිරීම සඳහා නිර්දේශ කිරීම

5:2:4 පක්ෂයේ විනය කටයුතු සම්බන්ධ විනය අභියාචනා කමිටුව පත් කිරීම

5:3 සමස්ත ලංකා කාරක සභාව අවම වශයෙන් වසර දෙකකට(2) වරක්වත් කැඳවිය යුතුය.

## 6 වන වගන්තිය : විධායක සභාව

6:1 සමස්ත ලංකා කාරක සභාවේ සමාජිකයන් අතුරින්, එකී සමස්ත ලංකා කාරක සභාව විසින් විධායක සභාවේ සමාජිකයන් තෝරා පත් කරනු ඇත.

6:2 විධායක සභාව පහත සඳහන් නිලධාරී මණ්ඩලයෙන් සමන්විත වේ.

සභාපති,
උප සභාපතිවරු පස් දෙනෙක්(5),
මහ ලේකම්,
උප ලේකම්වරු දෙදෙනෙක්(2)
භාණ්ඩාගාරික,
ජාතික සංවිධායක
විධායක සභිකයන් දහ දෙනෙක් (10)

## 6:3 බලතල හා වගකීම්

6:3:1 පක්ෂ සමාජිකත්වය ලබා දීම, සමාජිකත්වය අත් හිටුවීම හා සමාජිකත්වයෙන් ඉවත් කිරීම.
6:3:2 පක්ෂයේ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථා සංශෝධන යෝජනා කෙටුම්පත් කිරීම.
6:3:3 පක්ෂ අරමුදල හා පක්ෂයේ දේපළ පරිපාලනය
6:3:4 උපදේශක මණ්ඩලයට සමාජිකයන් පත් කිරීම හා ඉවත් කිරීම
6:3:5 ස්ථාවර කමිටු පත් කිරීම
6:3:6 සමාජිකත්වය සහ/හෝ ඔවුන් දරන්නා වූ නිලතල සම්බන්ධව විනය පරීක්ෂන පැවැත්වීම හා තීරණ ගැනීම
6:3:7 මැතිවරණ සඳහා නාම යෝජනා මණ්ඩල පිහිටුවීම හා නාම යෝජනා සම්බන්ධ අභියාචනා/ විරෝධතා සලකා බැලීම.
6:3:8 පක්ෂ සංවිධාන වෙත ස්ථාවර නියෝග පැනවීම හා ඒවා ක්‍රියාත්මක කිරීම
6:3:9 ස්ථාවර කමිටු වලට අමතරව අවස්ථාවෝචිත පරිදි අණු කමිටු හා අනුබද්ධ සංවිධාන ඇති කිරීම.
6:3:10 සමස්ත ලංකා කාරක සභාවට සාමාජිකයන් දහ දෙනෙකු(10) නම් කිරීම
6:3:11 පක්ෂ සංවිධානවල ක්‍රියාකාරිත්වය හා ඒවායේ නිලධාරී මණ්ඩල පිළිබඳ ඇගයීමකට ලක් කිරීම හා අවශ්‍ය වූ විටක එම සංවිධාන විසුරුවා හැරීමට සහ/හෝ තාවකාලික නිලධාරී මණ්ඩලයක් පත් කිරීම සහ/ හෝ නැවත නිලවරණයක් පැවැත්වීමට බලතල ඇත.

6:4 විධායක සභාව වසර දෙකක(2) කාලයක් සඳහා පත් වන අතර, අදාල වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට පෙර නැවත තෝරා පත් කර ගත යුතුය.

6:5 සමස්ත ලංකා කාරක සභාව 2/3 ක වැඩි ඡන්දයෙන් තීරණය කෙරෙන අවස්ථාවක විධායක සභාවේ නිල කාලය තවත් වසර 2ක් සඳහා පමණක් දීර්ඝ කල හැක.

## 6:6 විධායක සභාවේ සමාජිකත්වය අහෝසි වීම.

6:6:1 ඉල්ලා අස්වීමෙන්
6:6:2 සමස්ත ලංකා කාරක සභාවේ සියලු සමාජිකයන් සංඛ්‍යාවෙන්( නොපැමිණි සමාජිකයන්ද ඇතුලුව) 2/3 වැඩි ඡන්දයෙන් ඉවත් කිරීමට තීරණය කිරීමෙන්,
6:6:3 යම් සමාජිකයෙකුට අදාල ධුරය දැරීමට නොහැකි වන ආකාරයෙන් කායික හා මානසික දුබලතාවයෙන් පෙළෙන බව ඒත්තු ගත හැකි සාක්ෂි ඇති බව විධායක සභාවට ඒත්තු ගියහොත්,
6.6.4. විනය චෝදනාවක් මත සමාජිකත්වයෙන් හා නිල තත්වයෙන් ඉවත් කරනු ලැබුවහොත්,

6:7 විධායක සභාවේ නිල කාලය අවසන් වීමට පෙර, විධායක සභික තනතුරක් හිස් වූ විට, ඒ සඳහා අනුප්‍රාප්තිකයෙකු පත් කිරීම විධායක සභාව විසින් කල යුතු අතර, නිලධාරි මණ්ඩලයේ තනතුරක් හිස් වූ විට අනුප්‍රාප්තිකයෙකු පත් කෙරෙන තුරු , වෙනත් නිලධාරියෙකු එම තනතුරේ වැඩ බැලිය යුතුය.

6:8 විධායක සභාවේ තීරණ, නොපැමිණි විධායක සභිකයන්ද ඇතුලුව වැඩි ඡන්දයෙන් තීරණය විය යුතුය.

6:9 සාමාන්‍ය විධායක සභා රැස්වීමක් පිළිබඳව, න්‍යාය පත්‍රයේ පිටපතක් සහිතව අවම වශයෙන් දින පහකට(5) පෙර දැනුම් දිය යුතුය. එසේ වුවද සියලු සමාජිකයන් එකඟ වේ නම්, එකී දින පහේ(5) දැනුවීම නොමැතිව වුවද, රැස්වීමක් කැඳවිය හැක.

6:10 විධායක සභාවට න්‍යාය පත්‍රයෙන් පිටස්තර කරුණු සාකාච්ඡා කල නොහැක. යම් කරුණක් සාකච්ඡා කිරීමට අවශ්‍ය නම්, විධායක සභිකයෙකු විසින් අදාල කරුණ පිළිබඳව අවම වශයෙන් දින හතකට(7) පෙර මහ ලේකම්වරයාට ලිඛිතව දැන් විය යුතුය.

6:11 රැස්වීම් කැඳවීම ,මහ ලේකම්වරයා විසින් කළ යුතුය.

## 7වන වගන්තිය : ස්ථාවර කමිටු

7:1 විධායක සභාව විසින් සමස්ත ලංකා කාරක සභාවේ සාමාජිකයන් අතුරින් පහත දැක්වෙන ස්ථාවර කමිටු පත් කරනු ඇත.

අ) මුදල් කමිටුව
ආ) ප්‍රචාරක කමිටුව
ඇ) සැලසුම් හා පර්යේෂණ කමිටුව
ඈ) අධ්‍යාපන හා සංස්කෘතික කමිටුව
ඉ) ජාත්‍යන්තර කටයුතු කමිටුව

### 7:2 මුදල් කමිටුව

7:2:1 භාණ්ඩාගාරික, සභාපති, මහා ලේකම් හා ජාතික සංවිධායක සහ මූල්‍ය කටයුතු පිළිබඳ මනා දැනුමක් ඇති පුද්ගලයන් තිදෙනෙකු (3) ඇතුලුව සාමාජිකත්වය හත් (7) දෙනෙකි. භාණ්ඩාගාරික මුදල් කමිටුවේ කැඳවුම්කරු වේ.

7:2:2 වගකීම්

1. පක්ෂයේ මූල්‍ය පාලනය
2. පක්ෂයේ ගිණුම් පවත්වා ගෙන යාම
3. පක්ෂයේ නිශ්චල හා චංචල දේපළ වල භාරකාරත්වය දැරීම
4. විධායක සභාවේ පූර්ව අනුමැතියට යටත්ව පක්ෂය වෙනුවෙන් දේපළ මිලදී ගැනීම.

5. විධායක සභාවට වාර්ෂිකව අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම හා අනුමැතිය ලබා ගැනීම.

6. පක්ෂයේ ජාතික මහා සම්මේලනයට අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම

## 7:3 ප්‍රචාරක කමිටුව

7:3:1 ජාතික සංවිධායක සහ තවත් සාමාජිකයන් හය දෙනෙකු (6) ඇතුලුව සාමාජිකත්වය හත් (7) දෙනෙකි. ජාතික සංවිධායක ප්‍රචාරක කමිටුවේ කැඳවුම්කරු වේ.

7:3:2 වගකීම්

1. පක්ෂයේ අරමුණු හා ප්‍රතිපත්ති ජනතාව අතර ප්‍රචලිත කිරීම
2. මැතිවරණ වලදී ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම
3. විධායක සභාවේ අනුමැතිය ලත් පක්ෂයේ පුවත්පත හා වෙනත් ප්‍රකාශන පල කිරීම

## 7:4සැලසුම් හා පර්යේෂණ කමිටුව

7:4:1විධායක සභාව විසින් නම් කරනු ලබන උප සභාපතිවරයෙකු සහ තවත් සාමාජිකයන් හය දෙනෙකු (6) ඇතුලුව සාමාජිකත්වය හත් (7) දෙනෙකි. විධායක සභාව විසින් නම් කරනු ලබන උප සභාපති සැලසුම් හා පර්යේෂණ කමිටුවේ කැඳවුම්කරු වේ.

7:4:2 පක්ෂයේ සංවර්ධනයට අදාල කටයුතු සැලසුම් කිරීම, අදාල තොරතුරු එක්රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම කමිටුවේ වගකීම වේ.

## 7:5 අධ්‍යාපන හා සංස්කෘතික කමිටුව

7:5:1විධායක සභාව විසින් නම් කරනු ලබන උප සභාපතිවරයෙකු සහ තවත් සාමාජිකයන් හය දෙනෙකු (6) ඇතුලුව සාමාජිකත්වය හත් (7) දෙනෙකි. විධායක සභාව විසින් නම් කරනු ලබන උප සභාපති අධ්‍යාපන හා සංස්කෘතික කමිටුවේ කැඳවුම්කරු වේ.

7:5:2 වගකීම්

1. පක්ෂයේ සමාජිකයන්ට දේශපාලන, සමාජ හා ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යාපනය ලබා දීම.
2. පක්ෂයේ පුස්තකාලය පවත්වා ගෙන යාම
3. කලා හා සංස්කෘතික සම්බන්ධතා ඇති කර ගැනිම

## 7:6 ජාත්‍යන්තර කටයුතු පිළිබඳ කමිටුව

7:6:1 විධායක සභාව විසින් නම් කරනු ලබන උප සභාපතිවරයෙකු සහ තවත් සාමාජිකයන් හය දෙනෙකු (6) ඇතුලුව සාමාජිකත්වය හත් (7) දෙනෙකි. විධායක සභාව විසින් නම් කරනු ලබන උප සභාපති ජාත්‍යන්තර කටයුතු කමිටුවේ කැඳවුම්කරු වේ.

7:6:2 වගකීම්

1. ජාත්‍යන්තර සබඳතා ඇති කර ගැනීම හා පවත්වාගෙන යාම
2. තානාපති අංශ සමඟ සබඳතා පවත්වා ගෙන යාම
3. පක්ෂයේ ප්‍රචාරක කටයුතු ජාත්‍යන්තරව පවත්වා ගෙන යාම
4. විදේශගත ශ්‍රී ලාංකිකයන් සංවිධානගත කිරීම හා ඔවුන් සමඟ සබඳතා පවත්වා ගෙන යාම
5. විදේශයන්ගෙන් මූල්‍යමය හා අනෙකුත් ආධාර ලබා ගැනීම

## 7:7ස්ථාවර කමිටු සම්බන්ධ පොදු විධි විධාන

7:7:1. ස්ථාවර කමිටු වල නිල කාලය විධායක සභාවේ නිල කාලයට අනුරූපව අවසාන වන්නේය.

7:7:2 ස්ථාවර කමිටු සාමාජිකයන්ට මහ ලේකම්වරයාට කරනු ලබන ලිඛිත ඉල්ලීමකින් ඉල්ලා අස් විය හැක.

7:7:3 පක්ෂයේ විධායක සභාවට ස්ථාවර කමිටු වල ඕනෑම සාමාජිකයෙකු හේතු රහිතව ඉවත් කල හැක.

## 8 වන වගන්තිය : දිස්ත්‍රික් කමිටු

8:1 විධායක සභාව විසින් තීරණය කරනු ලබන මැතිවරණ දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් කමිටු පිහිටුවනු ලැබේ.

8:2 අදාල දිස්ත්‍රික් සංවිධාන බල ප්‍රදේශය තුල පිහිටි සියලු ආසන සංවිධාන වල සභාපතිවරුන්ගෙන්,ලේකම්වරුන්ගෙන් හා භාණ්ඩාගාරිකවරුන්ගෙන් සමන්විතය.

8:3 සෑම දිස්ත්‍රික් කමිටුවකටම සභාපතිවරයෙකු හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ ලේකම්වරයෙකු වැඩි ඡන්දයෙන් තෝරා ගැනේ.

## 8:4 බලතල හා වගකීම්

8:4:1 දිස්ත්‍රික්කය තුල පිහිටි සියලු ආසන සංවිධාන එකිනෙක අතර හා විධායක සභාව අතර සම්බන්ධීකරණය කිරීම

8:4:2 දිස්ත්‍රික්කය තුල පක්ෂ කටයුතු අධීක්ෂණය

9

## 9 වන වගන්තිය : ආසන සංවිධාන

9:1 මැතිවරණ බල ප්‍රදේශ මට්ටමින් ක්‍රියාත්මක වේ.

9:2 අදාල ආසන සංවිධාන බල ප්‍රදේශය තුල පිහිටි සියලුම ශාඛා සංවිධාන වල සභාපතිවරුන් හා ලේකම්වරුන්ද ඇතුලුව ශාඛා සංවිධානයක සෑම සමාජිකයන් 20 කට එක් නියෝජිතයෙක් බැගින් වන ලෙස ආසන සංවිධානය සමන්විත වේ.

9:3 සෑම ආසන සංවිධානයකම සභාපති, උප සභාපතිවරු තිදෙනෙකු, ලේකම්, උප ලේකම්වරු තිදෙනෙකු, හා භාණ්ඩාගාරික,යන අයගෙන් නිලධාරි මණ්ඩලය සමන්විත විය යුතුය. එකී නිලධාරීන් ආසන සංවිධානයේ සමාජික ඡන්දයෙන් තේරි පත් විය යුතුය.

### 9:4 බලතල හා වගකීම්

9:4:1 දිස්ත්‍රික් කමිටුව දෙනු ලබන උපදෙස් මත පක්ෂයේ සියලු කටයුතු අදාල ප්‍රදේශය තුල ඉටු කිරිම

9:4:2 අදාල ආසන සංවිධාන බල ප්‍රදේශය තුල ප්‍රචාරක කටයුතු ඉටු කිරීම හා සමාජිකයන් බඳවා ගැනීම හා ශාඛා සංවිධාන පිහිටු වීමට අනුමැතිය දීම

9:4:3 ආසන සංවිධානය විසින් පක්ෂය වෙනුවෙන් අරමුදල් රැස් කල යුතුය.එසේ ලබා ගන්නා මුදල් සඳහා භාණ්ඩාගාරික විසින් පක්ෂයේ නිල රිසිට්පත් නිකුත් කල යුතුය.

9:4:4 විධායක කමිටුව විසින් තීරණය කරන උපරිම මුදලකට යටත්ව ආසන සංවිධානයට ගිණුමක් පවත්වා ගෙන යා හැකි අතර ඉතිරි මුදල් පක්ෂ අරමුදලට බැර කල යුතුය.

9:4:5 ආසන සංවිධානයේ වාර්ෂික සම්මේලනයකදී සම්මත කරන ලද අයවැය වාර්තාවක් මුදල් කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය.

9:4:6 ආසන සංවිධානය අවම වශයෙන් මාස 2කට වරක්වත් රැස්විය යුතුය.

9:4:7 ආසන සංවිධානය අදාල දිස්ත්‍රික් කමිටුව සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය.

## 10 වන වගන්තිය : ශාඛා සංවිධානය

10:1 ග්‍රාම සේවා වසමකට හෝ වෙනත් කුඩා භූගෝලීය බෙදීමකට අනුව හෝ ආයතන මට්ටමින් හෝ ශාඛා සංවිධාන පිහිටුවිය හැක. මේ සඳහා අදාල අදාල ප්‍රදේශයේ ආසන සංවිධානයේ අනුමැතිය ලබා ගත යුතුය.

10:2 පක්ෂයේ සාමාජිකයන් විසි දෙනෙකුට(20) එකතුව ශාඛා සංවිධානයක් පිහිටු විය හැක.

10:3 සභාපති, ලේකම්, හා තවත් කාරක සභිකයන් පස් දෙනෙකුගෙන් ශාකා සංවිධානයේ නිලධාරි මණ්ඩලය සමන්විත වනු ඇත.

10:4 බලතල හා වගකීම්

10:4:1 පක්ෂ ව්‍යවස්ථාවට අනුකූලව පක්ෂයේ උන්නතිය සඳහා කටයුතු කිරීම

10:4:2 පක්ෂයේ අදාල දිස්ත්‍රික් කමිටුව හා ආසන සංවිධානය විසින් දෙනු ලබන උපදෙස් මත පක්ෂයේ සියලු කටයුතු ශාඛාව තුල ඉටු කිරීම

10:4:3 පක්ෂයට සාමාජිකයන් බඳවා ගැනීම

## 11 වන වගන්තිය : අනුබද්ධ සංවිධාන

11:1 ජාතික ජනතා පක්ෂය යටතේ පහත සඳහන් අනුබද්ධ සංවිධාන පිහිටුවිය හැක.

1. ජාතික ජනතා කාන්තා සංවිධානය
2. ජාතික ජනතා ශිෂ්‍ය සංවිධානය
3. ජාතික ජනතා වෘත්තිකයන්ගේ සංවිධානය
4. ජාතික ජනතා ගොවි සංවිධානය
5. ජාතික ජනතා කම්කරු සංවිධානය
6. ජාතික ජනතා කලා සංවිධානය
7. ජාතික ජනතා පැවිදි සංවිධානය

11:2 පක්ෂයේ අනුබද්ධ සංවිධාන සම්බන්ධයෙන් ව්‍යවස්ථා මාලාවක් සැකසීම විධායක සභාව විසින් කරනු ඇත.

## 12 වන වගන්තිය :පක්ෂ සමාජිකත්වය

12:1 වෙනත් දේශපාලන පක්ෂයක සමාජිකයෙකු නොවන ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුට පක්ෂ සමාජිකත්වය ලබා ගත හැක.

12:2 සමාජික අයදුම්පත්‍රයක් සමාජික ගාස්තුව සමඟ ශාඛා සංවිධානයට හෝ ආසන සංවිධානයට ඉදිරිපත් කල හැක. එසේත් නොමැති නම් මහ ලේකම්වරයාට සෘජුවම ඉදිරිපත් කිරීමද කල හැක.

12:3 මාස තුනක නිරීක්ෂණ කාලයකට පසුව විරෝධතා නොමැති ශාඛා හෝ ආසන සංවිධානය විසින් විධායක සභාවට ඉදිරිපත් කල යුතුය.

12:4 විරෝධතා නොමැති නම් විධායක සභාව විසින් සාමාජිකත්වය පිරි නමනු ලැබේ. මහලේකම්වරයාට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සම්බන්ධයෙන්ද මාස තුනක(3) නිරීක්ෂණ කාලය සලකා බලා විධායක සභාව විසින් සාමාජිකත්වය පිරි නමනු ඇත.

12:5 සෑම සාමාජිකයෙකුටම සමාජික පත්‍රයක් නිකුත් කරනු ලැබේ. එය අවශ්‍ය අවස්ථා වලදී ඉදිරිපත් කල යුතුය.

12:6 ඕනෑම වර්ෂයක දෙසැම්බර් මාසයේ පළමු වැනිදාට පෙර නියමිත මුදල් ගෙවා සාමාජිකත්වය අලුත් කල යුතුය. සාධාරණ හේතුවකින් තොරව අනුයාත වර්ෂ දෙකක් සමාජිකත්වය අලුත් නොකිරිමෙන් සිය සමාජිකත්වය අහෝසි වේ. එම තැනැත්තා නැවත නව සමාජිකයෙකු ලෙස ලියාපදිංචි කල යුතුය.

12:7 පක්ෂ සාමාජික මුදල විධායක සභාව විසින් තීරණය කරනු ඇත.

12:8 පක්ෂයේ මහ ලේකම්වරයා සාමාජික හා සංවිධාන වල නිලධාරි මණ්ඩල ලේඛණ පවත්වා ගත යුතුය.

## 13 වන වගන්තිය : සාමාජිකයන්ගේ යුතුකම්, වගකීම් හා අයිතිවාසිකම්

### 13:1. සාමාජිකයන්ගේ යුතුකම් හා වගකීම්

13:1:1. පක්ෂයේ ප්‍රත්පත්ති රැකීමටත් ,අරමුණු මුදුන් පත් කර ගැනීමටත්, පක්ෂය ජනතාව අතර ප්‍රචලිත කිරීමටත්, පක්ෂයේ තීරණ අනුව සැම විටම ක්‍රියා කිරීමටත්, සැම සාමාජිකයෙකුම බැඳී සිටී.

13:1:2 පක්ෂයේ නීති රීති පිළිපැදීමට බැඳී සිටී.

13:1:3 සියලු මැතිවරණ පක්ෂය විසින් නාම කරන අපේක්ෂකයන්ට අධාර හා සහාය දැක්වීම.

13:1:4. පක්ෂයට හානිකර කටයුතු වලින් වැලකීම

### 13:2 සමාජිකයන්ගේ අයිතිවාසිකම්

13:2:1 පක්ෂයේ ක්‍රියාකාරි කටයුතු වලට සහභාගි වීම

13:2:2 අදාල පක්ෂ සංවිධාන වල නිලවරණ සඳහා ඉදිරිපත් වීම.

13:2:3 අදාල පක්ෂ සංවිධාන වල නිලවරණ වලදී ඡන්දය පාවිච්චි කිරීම

13:2:4 පක්ෂයේ පුස්තකාලය පරිහරණය කිරිම.

## 14 වන වගන්තිය : පක්ෂ විනය

14:1 විනය විරෝධී චෝදනාවකට ලක් වන සමාජිකයෙකුගේ පක්ෂ සාමාජිකත්වය අත් හිටුවීම විධායක සභාවේ අභිමතය පරිදි සිදු කල හැක. එසේම පක්ෂ සාමාජිකත්වය අත් හිටු වීමද ඉවත් කිරීමද විධායක සභාවට කළ හැක.

14:2 විනය චෝදනාව පිළිබඳ ලිඛිත දැන්වීමක් අදාල සාමාජිකයාට විධායක සභාව විසින් විසින් කල යුතුය.

14:3 එම චෝදනා පිළිබඳ දැන්වීම ලැබී දින් 14ක් ඉක්ම යාමට පෙර අදාල සාමාජිකයා විසින් පිළිතුරු විධායක සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

14:4 පක්ෂයේ විනය කමිටුව විසින් අදාල චෝදනා විභාග කොට විධායක සභාවට වාර්තා කළ යුතුය.

14:5 විනය කමිටුවේ වාර්තාව පදනම් කොට ගෙන චෝදනාවට ලක් වූ සාමාජිකයා සම්බන්ධයෙන්, සාමාජිකත්වයෙන් ඉවත් කිරීම, තිලයෙන් ඉවත් කිරිම, මන්ත්‍රී ධූරයෙන් ඉවත් කිරීම, නිශ්චිත කාලයක් සඳහා සාමාජිකත්වය අත් හිටුවීම ඇතුලු සුදුසු විනය දඬුවමක් පැනවීම විධායක සභාව විසින් කල හැකිය.

14:6 විධායක සභාව විසින් ගන්නා වූ ලබන තීරණයෙන් අතෘප්තියට පත් වන පාර්ශවයට පක්ෂයේ විනය අභියාචනා මණ්ඩලය වෙත දින 14 ක් ඇතුලත අභියාචනය කිරීමේ අයිතිය ඇත. එම විනය අභියාචන මණ්ඩලයෙන් දෙනු ලබන තීරණය අවසානාත්මක හා තීරණාත්මක වේ.

## 15 වන වගන්තිය : පක්ෂයේ විනය කමිටුව

15:1 පක්ෂයේ උප සභාපතිවරු පස් දෙනා (5) අතරින් තුන් දෙනෙකුගෙන් (3) සමන්විත වූ විනය කමිටුවක් අවශ්‍ය වූ විටකදී විධායක සභාව විසින් නම් කරනු ඇත.

15:2 එම විනය කමිටුව විසින් තම නිර්දේශ විධායක කමිටුවට ඉදිරිපත් කළ යුතු අතර, එම නිර්දේශ මත විධායක සභාව විසින් සුදුසු තීරණයක් කරනු ඇත.

## 16 වන වගන්තිය : පක්ෂයේ විනය අභියාචනා මණ්ඩලය

16:1 සමස්ත ලංකා කාරක සභාව විසින් හත් දෙනෙකුගෙන් (7) යුක්ත වූ විනය අභියාචනා මණ්ඩලයක් පත් කරනු ඇත. එම සාමාජිකයන් අතරින් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා විසින් නම් කරනු ලබන තුන් දෙනෙකුගෙන් (3) යුත් අභියාචනා කමිටුවක් විසින් ඉහතින් සඳහන් කළ අභියාචනය පිළිබඳව සලකා බලා තීරණය කරනු ඇත.

## 17 වන වගන්තිය :උපදේශක මණ්ඩලය

17:1 ජාතික ජනතා පක්ෂයට උපදේශක මණ්ඩලයක් වන්නේය.

17:2 පක්ෂයේ විධායක සභාව විසින් පක්ෂයේ උන්නතිය උදෙසා උපදෙස් ලබා ගත හැකි ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් උපදේශක මණ්ඩලයක් පත් කර ගත යුතුය. උපදේශක මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව කලින් කලට විධායක සභාව විසින් තීරණය කරනු ඇත.

## 18 වන වගන්තිය : පක්ෂ අරමුදල

18:1 පක්ෂ අරමුදල විධායක සභාවේ පරිපාලනයට යටත්ව මුදල් කමිටුව විසින් පාලනය කරනු ලබයි.

18:2 පක්ෂ අරමුදලට ලැබෙන සියලු මුදල් සඳහා කුවිතාන්සි නිකුත් කිරීම භාණ්ඩාගාරික විසින් කල යුතුය.

18:3 පක්ෂ අරමුදලේ මුදල්, විධායක සභාව තීරණය කරන බැංකු වල පක්ෂයේ නමින් ගිණුම් පවත්වා ගෙන යා යුතුය. බැංකු වල තැන්පත් මුදල් ගණුදෙණු කල යුත්තේ සභාපති, මහලේකම් හා භාණ්ඩාගාරික යන තිදෙනාගෙන් දෙදෙනෙකුගේ අත්සන් සහිතවය.

එසේ වුවද අවශ්‍ය වූ අවස්ථාවකදී බැංකු ගණුදෙණු කටයුතු සඳහා විධායක සභාවේ සාමාජිකයකුට බලය පැවරීමට විධායක සභාවට බලය ඇත

18:4 සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව අවශ්‍ය හදිසි වියදම් කිරීමට භාණ්ඩාගාරිකට බලය ඇත. එසේ කරන ලද වියදම් පිළිබඳ විස්තරයක් මුදල් කමිටුවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගත යුතුය.

18:5 පක්ෂයේ අරමුදල පිළිබඳව ගණන් පරීක්ෂකවරයෙකු විසින් සකසන ලද සම්පූර්ණ අය වැය වාර්තාවක් මුදල් කමිටුව විසින් විධායක සභාවට සෑම වාර්ෂිකව අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය.

## 19 වන වගන්තිය : පක්ෂයේ චංචල හා නිශ්චල දේපළ

19:1 පක්ෂයේ අරමුණු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී පක්ෂය වෙනුවෙන් චංචල හා නිශ්චල දේපළ මිලදී ගැනීමට, බද්දට ගැනීමට හා කුලියට ගැනීමට හා පරිත්‍යාග භාර ගැනීමට පක්ෂයේ මුදල් කමිටුවට හැකිය. එසේම පක්ෂය සතු දේපළ විකිණීමට, බදු දීමට හෝ කුලියට දීමටද මුදල් කමිටුවට බලය ඇත.

19:2 දේපළ පිළිබඳ ගණුදෙනු පක්ෂයේ මුදල් කමිටුවේ අනුමැතිය ඇතිව, සභාපති, මහ ලේකම් හා භාණ්ඩාගාරික යන තිදෙනාගෙන් දෙදෙනෙකුගේ අත්සනින් විය යුතුය.

19:3 දේපළ මිලදී ගැනීම් වලදී වටිනාකම රු ලක්ෂ දහය(10) ඉක්මවන අවස්ථාවලදී පක්ෂයේ විධායක සභාවේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ. එසේම දේපළ විකිණීමේදී හෝ දීර්ඝ කාලීන බදු දීම් වලදීද විධායක සභාවේ පූර්ව අනුමැතිය ලැබිය යුතු වේ.

## 20 වන වගන්තිය : නිලවරණ

20:1 සියලු නිලවරණ අදාල කාලසීමාව ඉකුත් වීමට පෙර පැවැත්විය යුතුය.

20:2 විධායක සභාවේ අනුමැතිය මත පමණක් නිලවරණ සාධාරණ කාලයක කල් දැමිය හැකිය.

20:3 කවර හෝ නිලවරණයක් සම්බන්ධයෙන් පක්ෂ සාමාජිකයෙකුට සෑහීමකට පත් විය නොහැකි නම්, පක්ෂයේ විධායක සභාවට පැමිණිලි කිරීමට ඒ සාමාජිකයාට අයිතිය ඇත. එසේම යම් නිලවරණයක් සාධාරණව නොපැවැත්වූයේ යැයි විධායක සභාවට ඒත්තු ගියේ නම් එම නිලවරණය අහෝසි කොට නැවත නිලවරණයක් පැවත්වීමට නියෝග කිරීමට විධායක සභාවට බලය ඇත.

## 21 වන වගන්තිය : ව්‍යවස්ථා සංශෝධන

21:1 ජාතික ජනතා පක්ෂ ව්‍යවස්ථාවට සංශෝධන ඇතුලත් කිරීම පක්ෂයේ විධායක සභාවේ කෙටුම්පත් මත සමස්ත ලංකා කාරක සභාව විසින් කරනු ඇත.

21:2 විධායක සභාවේ ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත සමස්ත ලංකා කාරක සභාවේ 2/3 ක ඡන්දයෙන් සම්මත විය යුතුය.

## 22 වන වගන්තිය : පොදු විධිවිධාන

22:1 ජාතික ජනතා පක්ෂයේ සියලු සංවිධාන වල සාමාජිකයන්ගෙන් කවරෙකු හෝ , සාධාරණ හේතු දැක්වීමකින් තොරව අනුයාත රැස්වීම් තුනකට(3) සහභාගි නොවුනහොත් ඔහු නියෝජනය කරන සංවිධානයේ සමාජිකත්වය අහෝසි වේ.

22:2 පක්ෂයේ සෑම සංවිධානයකම රැස්වීම් සඳහා සණපූරණය අදාල සංවිධානයේ සාමාජිකත්වයෙන් 1/3ක් විය යුතුය.

22:3 ජාතික ජනතා පක්ෂ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් අර්ථ නිරූපනය කිරීමේ අයිතිය විධායක සභාව සතුය.

22:4 මෙම ව්‍යවස්ථාවේ ඉංග්‍රීසි හෝ දෙමළ පිටපත සම්බන්ධයෙන් යම් අනනුකූලතාවයක්, හෝ නොපැහැදිලිතාවයක් ඇති වුවහොත් සිංහල පිටපත බල පැවැත්විය යුතුය.

- සිද්ධි රස්තු -